(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 448.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 අප්‍රේල් මස 09 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4836/'14

1\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති "කෝප් සිටි" වෙළඳසැල් සංඛ්‍යාව මැතිවරණ කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා යොදවා ඇති මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) කෝප් සිටි වෙළඳසැල් වෙතින් මිලදී ගන්නා භාණ්ඩ වෙනුවෙන් පාරිභෝගිකයින්ට බිල්පත් නිකුත් කරනු ලබන්නේද;

(iv) එසේ නම්, නිකුත් කරනු ලබන එම බිල්පත්වල මිලදී ගත් එක් එක් භාණ්ඩයේ නම සහ මිල සඳහන් වන්නේද;

(v) සෑම කෝප් සිටි වෙළඳසැලකින්ම පැහැදිලි බිල්පත් නිකුත් නොකරන බව දන්නේද;

(vi) සමහර කෝප් සිටි වෙළෙඳසැල් බිල්පත් නිකුත් නොකිරීමටත්, තවත් සමහර ඒවා බිල්පත් නිකුත් කිරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4992/'14

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කුමාරතුංග මුනිදාස ශ්‍රීමතානන් උපන් බිම වන ඉදිගස්ආරේ, දික්හේන නම් ඉඩම එවකට පැවති සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයට පවරා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එහි සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවදාද;

(iii) එම සංවර්ධන සැලැස්ම සකස් කළ අය කවුරුන්ද;

(iv) එම සැලැස්ම යම් ආයතනයක් මගින් අනුමත කරනු ලැබුවේ නම්, එම ආයතනය කවරේද;

(v) මීට පෙර සකස් කරන ලද සැලසුම් නව සැලැස්ම සැකසීමේදී උපයෝගී කර ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5118/'14

3\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුකුලේගඟ විදුලි බලාගාරයෙහි තිබෙන විදුලි උත්පාදන යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් යන්ත්‍රයෙහි විදුලි උත්පාදන ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂය මුළුල්ලේ ඉහත සඳහන් සියලු විදුලි උත්පාදන යන්ත්‍ර ක්‍රියාත්මකව පැවතියේද;

(ii) නොඑසේ නම්, අක්‍රියව පැවති යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් යන්ත්‍රය අක්‍රියව තිබූ කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විදුලි උත්පාදන යන්ත්‍ර අක්‍රියවීමට හේතු කවරේද;

(v) අනාගතයේදී එම බලාගාරයේ යන්ත්‍ර අක්‍රිය නොවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5500/'14

4\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ එක් සේවකයෙකුට අවම වශයෙන් රු.96,000/- ක හා උපරිම වශයෙන් රු. 265,000/- ක වන්දි මුදලක් ගෙවා 1990.03.31 දින සිට එම ආයතනය වසා දමන බව එවකට පැවති රජයේ විෂය භාර අමාත්‍යවරයා විසින් 1990.03.23 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කළත්, එම සේවකයින්ට ගෙවා ඇත්තේ රු. 50,000/- ක මුදලක් පමණක් බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ඉතා අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවය කළ ඉහත සඳහන් සේවක පිරිසට ඉතිරි වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එවකට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සතුව පැවති නිල නිවාසවල අයිතිය එම අවස්ථාවේ එහි පදිංචිව සිටි සේවකයින්ට ලබා දෙන බවටත්, නිවාස නොමැති සෙසු සේවකයින්ට ඉඩම් ලබා දෙන බවටත් කළ ප්‍රකාශය අනුව, මේ වන විට සියලුම සේවකයින්ට නිවාස හෝ ඉඩම් ලබා දී අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම නිවාස හෝ ඉඩම් සඳහා මේ වන විට හිමිකම් ඔප්පු ලබා දී අවසන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5847/'14

5\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ, අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි ජුම්ආ දේවස්ථානයේ නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) පරිහරණයේදී සිදුවී යැයි කියන දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කරන්නේද;

(ii) එම දේවස්ථානයට අයත් දේපළවලින් ලැබෙන ආදායම හා වැය ශේෂය සම්බන්ධයෙන් විශේෂිත නව භාරකාර මණ්ඩලයක් යටතේ විගණනය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වකුෆ් දේපළ පරිහරණයේදී වංචා සහගත ලෙස, පුද්ගල නමින් ඔප්පු සකස් කොට පවරන ලද දේපළ තිබේද;

(ii) එසේ නම්, එවැනි දේපළ තහනම් කිරීමටත්, අදාළ පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමටත් උපදෙස් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5898/'15

6\.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, සීතාවකපුර නගර සභා බල ප්‍රදේශයේ, පිලිප් ගුණවර්ධන ක්‍රීඩා සංකීර්ණයේ දෙවැනි අදියර වූ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම මේ වන විට අවසන්කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩා මණ්ඩපය ජනතා අයිතියට පවරන දිනය කවරේද;

(iii) එම ක්‍රීඩා සංකීර්ණයේ දෙවැනි අදියර ජනතා අයිතියට පැවරීමෙන් පසුව එහි සංවර්ධන හා නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා සීතාවකපුර නගර සභාව විසින් කර ඇති ඉල්ලීමට අනුව එම ක්‍රීඩා සංකීර්ණය එකී නගර සභාව වෙත පැවරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5914/'15

7\.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.23 හෝ ආසන්න දිනක රාත්‍රී මොරවැව, මහදිවුල්වැව II පියවරේ පිහිටි ශ්‍රී ඉන්ද්‍රාරාම මහා විහාරස්ථානය පොලිසිය විසින් හදිසි පරීක්ෂාවකට ලක්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විහාරස්ථානයෙහි වැඩ සිටින නිකායික කාරක සංඝ සභික හා සම්මානනීය සංඝ සභික පූජ්‍ය පොල්හේන්ගොඩ උපරතන නාහිමිපාණන්වහන්සේගේ ආරක්ෂකයින්ගේ නිවාස ද පරීක්ෂාවට ලක්කිරීමේ අරමුණ කවරේද;

(ii) ඉහත පරීක්ෂාවන් සඳහා අවසර දුන් අය කවුරුන්ද;

(iii) එම පරීක්ෂාව සඳහා සහභාගී වූ නිලධාරීන් කවුරුන්ද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) "යහපාලනය" ප්‍රතිපත්තිය මත වත්මන් රජය පත්වීමෙන් පසුව පොලිසියේ හෝ වෙනත් ආරක්ෂක අංශයකට අයත් නිලධාරීන්ගේ පරීක්ෂාවන්ට ලක්කර ඇති බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම විහාරස්ථානයන්හි නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පරීක්ෂාවන්ට ලක් කිරීමේ අරමුණ කවරේද;

(iv) එම අරමුණ ඉටු වී තිබේද;

(v) පරීක්ෂාවට ලක්කරන ලද විහාරස්ථාන අතරින් නඩු පවරන ලද විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vi) ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4837/'14

8.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව මගින් පාලනය කරනු ලබන රෝහල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(ii) එම එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරු, හෙදියන්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් රෝහලේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4993/'14

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන, මාර/මොරවක බෞද්ධ මහා විද්‍යාලය ප්‍රාථමික පාසල් 5,000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට තෝරා ගත් පාසලක් බවත්;

(ii) එම පාසල සංවර්ධනය කිරීමට අදාළ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රුපියල් 625,471.43 ක් වන බවත්;

(iii) ඒ සඳහා වන ප්‍රජා දායකත්වය රුපියල් 135,471.43 ක් බවත්;

(iv) මේ වන විට එම ව්‍යාපෘතිය සඳහා පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රුපියල් 490,000.00 මුදලක් ගෙවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර/මොරවක බෞද්ධ මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා රුපියල් ලක්ෂ 7ක් වියදම් වූ බව පවසමින් සෑම සිසුවෙකුගෙන්ම රුපියල් 1000/=ක මුදලක් අය කර ගෙන ඇති බව දන්නේද;

(ii) එසේ මුදල් එකතු කිරීමට විදුහල්පතිවරයෙකුට බලයක් තිබේද;

(iii) එම මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(iv) එලෙස මුදල් එකතු කිරීමට බලයක් නොමැති නම්, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4838/'14

10.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2013 දක්වා කාලය තුළදී වයඹ පළාත් සභාව යටතේ පාලනය වූ පාසල්වල සේවය කර විශ්‍රාම ලැබූ සෞන්දර්ය ගුරුවරු සංඛ්‍යාව සංගීතය, නැටුම්, චිත්‍ර සහ නාට්‍ය හා රංග කලාව යන විෂයයන් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළදී උක්ත විෂයයන් සඳහා අලුතින් බඳවා ගත් සෞන්දර්ය ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) 2014 වර්ෂය තුළදී විශ්‍රාම යෑමට නියමිතව සිටි වයඹ පළාත් සභා පාසල්වල සේවය කළ ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4994/'14

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසලක් වසා දැමීමේ නීත්‍යානුකූල ක්‍රමවේදය කවරේද;

(ii) එම ක්‍රමවේදයට පරිබාහිරව කටයුතු කරන අයෙකුට ලබා දිය හැකි දඬුවම් හෝ එරෙහිව ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 ජනවාරි මාසයේ දී දකුණු පළාත් සභාව විසුරුවා හැරීමට පෙර ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ ධම්මකුසල විද්‍යාලය වසා දැමීමට එවකට සිටි පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා ඇතුළු බලධාරීන් කටයුතු කර ඇති බව දන්නේද;

(ii) එම විදුහල වසා දැමීමට අදාළව බලධාරීන් විසින් ඉදිරිපත් කර තිබූ හේතු කවරේද;

(iii) එම විදුහල වසා දැමීමේ ක්‍රියාවලිය නීත්‍යානුකූලව සිදු වී තිබේද;

(iv) නොඑසේ නම්, අදාළ බලධාරීන්ට විරුද්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාසලක් වසා දැමීමට වඩා එය ආරක්ෂා කර ගැනීම වඩාත් වැදගත්වන බැවින් අම්බලන්ගොඩ ධම්මකුසල විද්‍යාලය තවදුරටත් පවත්වාගෙන යෑමට අවශ්‍ය සම්පත් ලබාදීමට කටයුතු නොකළේ මන්ද;

(ii) එම විදුහල නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 සිට 13 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

ගරු රාජිව විජේසිංහ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු රාජිව විජේසිංහ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

2.

චම්පික ප්‍රේමදාස ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1892/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 31 දිනැති අංක 1895/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 29 දිනැති අංක 1899/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 14 දිනැති අංක 1901/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 24 දිනැති අංක 1903/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*21.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*22.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

23.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

24.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

25.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

26.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---